**වියළි කලාපයේ නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ( ණය අංක 2477-එස්ආර්අයි ප්‍රදාන අංක 0129/0130 එස්ආර්අයි )**

---

වියළි කලාපයේ නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2009 ජූනි 29 දින එළඹි අංක 2477 එස් ආර්අයි(එස්.එෆ්) සහ 2013 පෙබරවාරි 13 දින එළඹි 2977 - එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

වියළි කාලාපයේ නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, උතුරු පළාතේ මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සහ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය හා හලාවත වියළි කලාපීය නාගරික ජනගහනයේ භෞතික සමෘද්ධිය වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘති ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 163.33 ක් වන අතර, එයින් එජඩො මිලියන 123 ක් හෙවත් සියයට 75.31 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ජල මූල්‍යයන හවුල්කරු පහසුකම සඳහා නෙදර්ලන්ත භාර අරමුදලින් (නෙ හා අ) එජඩො මිලියන 2 ක් හෙවත් සියයට 1.22 ක ප්‍රදානයක් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණු අතර ඉතිරි ශේෂය වන එජඩො මිලියන 38.33 ක් හෙවත් සියයට 23.47 ක් ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. 2009 නොවැම්බර් 13 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2013 ජූනි 30 වනවිට නිම කිරීමට සැලසුම්කර තිබුණි. විස්තරාත්මක සැලසුම් වලදී ඇස්තමේන්තු කරන ලද පරිදි සිවිල් වැඩ සහ උපකරණ සඳහා යෙදවුම් අවශ්‍යතාවයන් වැඩිවීම හා බදු සහ ගාස්තු වැඩිවීම හේතුවෙන් මුලින් තීරණය කළ ව්‍යාපෘති පිරිවැය එජඩො මිලියන 50 කින් වැඩිවී තිබුණි. එජඩො මිලියන 40 ක් වූ අතිරේක මූල්‍යයනය ආසියානු සංවර්ධන බැංකුව විසින් 2012 දෙසැම්බර් 18 දින අනුමත කර තිබුණු අතර ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2016 ජූනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**---------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය,අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේනතු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිත ආයතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය හා ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම් ආදීය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල් ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) අග්‍රිම අරමුදල් වල ආරම්භක හා අවසාන ශේෂ, එම අරමුදල් ගිණුම්වලින් ආපසු ගැනීම් හා එම ගිණුම් වලට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සධාරණ විශ්වාසය තැබිය හැකිව තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ යේද යන බව,

## 3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , මෙම වාර්තාවේ 5 ඡේදයේ දක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයොජනය කර තිබුණු බව ,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳ තිබුණු බව,

(ඈ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ,

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

-------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 1,037,201,249 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,432,299,197 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වරශය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| කෙරී ගෙන යන වැඩ | 1,031,541,132 | 854,765,289 | 2,373,981,772 |
| දේපල පිරියත හා උපකරණ | 5,660,117 | 25,662,163 | 58,317,425 |
| | 1,037,201,249 | 880,427,452 | 2,432,299,197 |

**4.2 අග්‍රිම අරමුදල් ගිණුම්**

ව්‍යාපෘතිය විසිනු පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තා සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුම්වල මෙහෙයුම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| (I) | **ණය අංකය - 2477 (ආසබැ)** | එජඩො | රු. |
| | 2013 ජනවාරි 01 දිනට ශේෂය | 12,677 | 1,612,015 |
| | එකතු කළා -: ඌන පුරණයන් | 820,225 | 106,413,032 |
| | | 832,902 | 108,025,047 |
| | අඩුකළා ආපසු ගැනීම | 617,927 | 80,015,218 |
| | | 214,975 | 28,009,829 |
| | විනිමය වෙනස | - | 98,741 |
| | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 214,975 | 28,108,570 |

| | | | |
|---|---|---|---|
| (I I) | **ප්‍රදාන අංක - 129(ආසබැ)** | එජඩො | රු. |
| | 2013 ජනවාරි 01 ශේෂය | 1,187,255 | 151,036,049 |
| | එකතු කළා -: ඌන පුරණයන් | 1,286,800 | 168,136,271 |
| | | 2,474,557 | 319,172,320 |
| | අඩුකළා ආපසු ගැනීම | 1,792,084 | 232,021,797 |
| | | 682,473 | 87,150,523 |
| | විනිමය වෙනස | - | 2,084,902 |
| | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 682,473 | 89,235,425 |

| | | | |
|---|---|---|---|
| (I I I) | **ප්‍රධාන අංක - 130 (නොහාඅ)** | එජඩො | රු. |
| | 2013 ජනවාරි 01 දිනට ශේෂය | 141,225 | 17,962,084 |
| | එකතු කළා -: ඌන පුරණයන් | 73,445 | 9,611,929 |
| | | 214,700 | 27,574,013 |
| | අඩුකළා ආපසු ගැනීම | 29,955 | 3,909,534 |
| | | 184,745 | 23,664,479 |
| | විනිමය වෙනස | - | 491,430 |
| | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 184,745 | 24,155,909 |

## 5. විගණන නිරීක්ෂණ

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වවුචර් සහ අදාළ ආධාරක ලියකියවිලි නොමැතිවීම හේතුවෙන් 2008 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් දරන ලද රු.මිලියන 7.8 ක් වූ වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. මාගේ පෙර වර්ෂවල විගණන වාර්තා වලින්ද මෙම තත්ත්වය පෙන්වාදී ඇති නමුත් මෙම ගැටළුව නිවැරදි කිරීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් 2012 සහ 2013 වර්ෂවලදී ප්‍රසම්පාදනය කරන ලද පිළිවෙලින් රු.546,271 සහ රු.1,445,348 ක් වූ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබූ නමුත් 2014 ජූනි 30 වන විටත් එම ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිකිරීම් උපකරණ, ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා ණය සහ ප්‍රදාන ගිවිසුම් වල එජඩො මිලියන 57 ක මුදලක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ඉහත කාර්යය සඳහා 2009 සිට 2013 කාලපරිච්ඡේද තුළ දී ශ්‍රී ලංකා රජයේ අරමුදල් රු.12,213,794 ක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි.

(ඈ) ණය ගැණුම් පිරිවැය සඳහා වූ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

## 6. මූල්‍යය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

## 6.1 අරමුදල් උපයෝජනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය හා භෞතික ඉලක්කයන් කාර්තුමය වශයෙන් දක්වමින් සමස්ත ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම මත පදනම් වූ ප්‍රගති වාර්තා නොමැති වූ බැවින් ඉන් බැහැර වීම් හඳුනාගැනීම සඳහා හා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට යාන්ත්‍රණයක් හඳුන්වාදී නොතිබුණි. එබැවින් ඉහත සැලැස්ම ඵලදායී පාලන උපකරණයක් ලෙස ව්‍යාපෘති කාර්යයන් හි යොදා ගෙන නොතිබුණි.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | ආසබැ ණය | ආසබැ ප්‍රදාන | නෙහාඅ | ශ්‍රීලංර | එකතුව |
|---|---|---|---|---|---|
| එකඟ වූ දායකය (එජඩො මිලියන) | 99.78 | 23.22 | 2.00 | 38.33 | 163.33 |
| 2013 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති වියදම (එජඩො මිලියන) | 11.61 | 5.58 | 1.19 | 7.69 | 26.07 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් වශයෙන් | 12 | 24 | 60 | 20 | 16 |

(ඇ) 2013 වර්ෂයේදී උතුරු පළාතේ සංවර්ධන කටයුතු 4 ක් ක්‍රියාත්මක කිරිම සඳහා රු.මිලියන5,954 කට සමාන එ.ජ.ඩො මිලියන 50ක අතිරේක වෙන්කිරීමක් කර තිබූ අතර එයින් රු.මිලියන 40 ක් ආසබැ විසින් මුල්‍යායනය කිරිමට එකඟ වි තිබුණි. කෙසේවුවද වටිනාකම් එජඩො මිලියන 1.380 ක්වූ PIPES/VS&M/19 කොන්ත්‍රාත්තුව පමණක් සමාලොචිත වර්ෂයේදි ප්‍රදානය කර තිබුණු හෙයින් වෙන්කළ මුදල වූ එජඩො මිලියන 50කින් එජඩො මිලියන 49.7 ක් හෙවත් සියයට 99 ක් වරෂය අවසානයට උපයෝජනය කර නොතිබුණි.

(ඈ) මුල්‍යානය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය කළ අරමුදල් උපයොජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ ප්‍රතිපාදනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|---|
| | එජඩො | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආසබැ | 125.00 | 14,531 | 1,435 | 1,298.9 | 2,402.7 |
| ශ්‍රීලංර | 38.33 | 4,446 | 800 | 433.7 | 1,006.0 |
| එකතුව | 163.33 | 18,977 | 2,235 | 1,732.6 | 3,408.7* |

* අත්තිකාරම් හා උපචිත වියදම් ඇතුළත් නොවීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යාවලින් මෙම සංඛ්‍යා වෙනස් වේ.

අරමුදල් උපයෝජනය පිළිබඳ ඉහත තොරතුරු අනුව ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉලක්කගත තත්ත්වයට වඩා ඉතා පහළ තත්ත්වයක පවතින බව පෙන්නුම් කෙරේ.

**6.2 භෞතික කාර්ය සාධනය**

**--------------------------**

පහත නිරික්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජුනි 30 වන විට ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 47 ක් හා සියයට 16 ක් විය. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 62 ක් ඉකුත් වී තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ සැලසුම් අවස්ථාවේ වූ ප්‍රමාදයන් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වූ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම ප්‍රමාද වි තිබුණි.

(ඇ) ලංසුකරුවන් අතර වූ ආරවුල් හේතුවෙන් PIPES/CDP/18 යටතේ හලාවත හා පුත්තලම ප්‍රදේශ වල කරගෙනයාම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වැඩ නියමිත කාලය තුල ආරම්භ කිරිමට නොහැකිවිය. තෝරාගන්නා ලද කොන්ත්‍රාත් කරුවන් සඳහා ආසබැ එකඟත්වය ලබා නොදිම හේතුවෙන් තවදුරටත් ප්‍රමාද වි තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් අංක. PIPES/V/10

----------------------------------

විදේශ ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් වවුනියාවේ ජල සැපයුම් යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මක වූ කටයුතු පුමාදවී තිබුණි. කෙසේවුවද, ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව විදේශයෙන් සපයන ලද ද්‍රව්‍යය නියමිත පිරිවිතර සමග එකඟ නොවිම හේතුවෙන් ප්‍රතික්ෂේප කරතිබු බවද නිරික්ෂණය විය.